**ශීර්ෂය 117 - මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 20 දින ප්‍රධාන ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම වයවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙළ කළ මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)ඈ වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේය. ඒ අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයට අනුරූප බව ප්‍රකාශ කළ නොහැක.

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මහාමාර්ග අංශයට අදාලව කර තිබුණු නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයට අදාළ භාණ්ඩාගාර පොත්වල සඳහන් එකතුව රු. 123,418,859 ක ගාස්තු ආදායම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනමම දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව මුළු ආදායම ගිණුම්ගත කල යුතුය. | ඔබගේ උපදෙස් පරිදි ඉදිරි මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ නිවැරදි මූලාශ්‍රය යටතේ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරමි . |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.67,600,247,550 ක් වුවද, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි එය රු.67,887,468,424 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වටිනාකම නිසිපරිදි සටහන් කල යුතු වේ. | වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් රැස් කරන ආදායම භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් සේ සලකා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වූ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම තුල ඇතුලත් කර ඇත . |
| (ඇ) | භාණ්ඩාගාර පොත් අනුව, තැන්පතු ලැබීම් රු.1,373,147,081 ක් ලෙස සඳහන් වුවද, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.1,351,879,462 ක් ලෙස දක්වා තිබුණි. | මාසික ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාර පොත් හා සසඳා අදාල නිවැරදි කිරීම් කල යුතු වේ. | විගණන නිරීක්ෂණ වල පෙන්වා දී ඇති පරිදි භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් ලෙස දක්වා ඇති රු. 1,373,147,081 ක වටිනාකම තුළ මහා මාර්ග අංශයේ ශීර්ෂ අංක 117 යටතේ තැන්පතු ලැබීම් හා උසස් අධ්‍යාපන අංශයේ ශීර්ෂ අංක 166 යටතේ තැන්පතු ලැබීම් ද ඇතුලත් වේ. මෙම මුළු වටිනාකම ම මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ ඇතුලත් කිරීම නිවැරදි නොවන බැවින් ශීර්ෂ අංක 117 යටතේ තැන්පතු ලැබීම් වන රු.1,351,879,462 ක් පමණක් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ දක්වා ඇත. |
| (ඇ) | භාණ්ඩාගාර පොත් අනුව, අත්තිකාරම් ලැබීම් රු.42,287,268 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම අගය රු.13,220,824 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව රු.29,066,444 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, මුළු අත්තිකාරම් ලැබීම් ගිණුම්ගත කල යුතු වීම. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරි වර්ෂයේදී මුළු ලැබීම් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් "බී "ගිණුමේ ලැබීම් ලෙස ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ඉ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ කිසිඳු ලැබීමක් දක්වා නොතිබුණු නමුත් වෙනත් ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.163,802,015 ක් රැස් කර තිබුණි. ඉන් රු.12,616,139 ක් ආදායමෙන් ආපසු ගෙවා තිබුණි. 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාර, වෙනත් ලැබීම් ලෙස රු. 151,185,876 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණු අතර ආකෘති පත්‍රයේ සඳහන් නොවූ ආදායමෙන් ආපසු | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් වෙනම සඳහන් කල යුතු වීම. | රු .151,185,876 වටිනාකම සෑදී ඇත්තේ පහත සඳහන් පරිදි වේ.<br>අනෙකුත් ආදායම් ලැබීම් රු .163,802,015<br>(-)ආදායම් ආපසු ගෙවීම් රු .12 ,616 ,139<br>ශුද්ධ ආදායම ලැබීම් රු .151,185,87<br>අනෙකුත් ආදායම් ලැබීම් රු.163,802,015ක මුදල, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ භාණ්ඩාගාරයෙන් ලැබුනු අක්මුදල් ලෙස සටහන් කර ඇති රු.67,887,468,424 ක වටිනාකමෙහි ඇතුලත් කර ඇති බැවින් |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් ලෙස රු. 12,616,139 ක් දක්වා තිබුණි. | | විගණනයෙන් පෙන්වා ඇති රු.151,185,876 මුදල ද මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ නිවැරදිව ඇතුලත්ව ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඊ) | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගෙවීම් රු.1,617,026,030 ක් ලෙස සඳහන් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එම අගය රු.1,661,942,323 ක් ලෙස දක්වා තිබුණි. | මාසික ගිණුම් සාරාංශ මඟින් භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීම් කර වර්ෂය අවසාන වන විට ශේෂ නිවැරදි කර ගැනීමට කටයුතු කල යුතුය. | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගෙවීම් ලෙස දක්වා ඇති රු. 1,617,026,030 ක වටිනාකමෙහි මහාමාර්ග අංශයේ ශීර්ෂ අංක 117 යටතේ තැන්පතු ලැබීම් හා උසස් අධ්‍යාපන අංශයේ ශීර්ෂ අංක 166 යටතේ තැන්පතු ගෙවීම්ද ඇතුලත්වේ. මෙම මුළු වටිනාකම ම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුලත්කිරීම නිවැරදි නොවන බැවින් ශීර්ෂ අංක 117 යටතේ තැන්පතු ගෙවීම් වන රු.1,661,942,323 ක් පමණක් නිවැරදිව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇත. |
| (උ) | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.39,228,348 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි එම අගය රු.23,674,180 ක් ලෙස දක්වා තිබුණි. | අත්තිකාරම් ගෙවීම් සියල්ල නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් වල නිරූපනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, අග්‍රිම ලැබීම් රු.67,600,247,550 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.67,887,468,424 ක් ලෙස සඳහන් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අග්‍රිම ලැබීම් නිසි පරිදි සඳහන් කල යුතුය. | රු. 287,365,856 ක් වන වෙනත් ආදායම් ලැබීම් 2019.12.03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 7(ii) උපදෙස් ප්‍රකාරව අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් සේ සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් ලෙස සටහන්ව ඇති රු.67,887,468,424 ක වටිනාකමට ඇතුලත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.29,418,965 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.28,781,939 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් වෙනම සඳහන් කල යුතුය. | ඉදිරියේදී සියළුම අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අංශයට අදාලව රැස් කර ගත් ගාස්තු ආදායම වන රු.123,418,859 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගාස්තු ලැබීම් යටතේ සටහන් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, ගාස්තු ආදායම වෙනම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සඳහන් කල යුතුය. | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අංශයේ ගාස්තු ලැබීම් රු.123,418 ,859 ක් වන ආදායම ගාස්තු ලැබීම් යටතේ දක්වා නොතිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් යටතේ දක්වා ඇති රු. 67,887,468,424 ක වටිනාකම තුල ඇතුලත්ව ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඈ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, ආදායම් නොවන වෙනත් ලැබීම් ලෙස රැස් කර තිබූ රු.151,185,875 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, ආදායම් නොවන වෙනත් ලැබීම් වෙනම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සඳහන් කල යුතුය. | ආදායම් නොවන වෙනත් ලැබීම් ලෙස රැස් කර තිබූ රු.151,185,875 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් යටතේ දක්වා ඇති රු.67,887,468,424 ක වටිනාකම තුල ඇතුලත්ව ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඉ) | පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු. 333,596,037 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් විය යුතු වුවත් එය රු.11,990,241 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සටහන් කල යුතුය. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් වල නිරූපනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකරගැනීම් රු.31,108,736 ක් වී තිබුණත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.1,230,582 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.29,878,154 ක්අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම නිසිපරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සඳහන් කල යුතුය. | අත්තිකාරම් ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත්තේ සරප් වෙත මුදලින් ලැබූ අත්තිකාරම් ලැබීම් ප්‍රමාණයයි .හරස් සටහන් හරහා වැටුපෙන් ලද අත්තිකාරම් ලැබීම් රු.11,990,241ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.321,605,796 ට ගලපා ඇත . |

| | | | |
|---|---|---|---|
| (උ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, අත්තිකාරම් ගෙවීම් රු.40,925,066 ක් වුවත් එය රු.17,250,886 ක් අඩුවෙන් රු.23,674,180 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම නිසිපරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සඳහන් කල යුතුය. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් වල නිරූපනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඌ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව තැන්පතු ලැබීම් සහ ගෙවීම් පිළිවෙලින් රු.1,351,646,095 ක් සහ රු.1,371,636,310 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම අගයන් පිළිවෙලින් රු.1,351,879,462 ක් සහ රු.1,384,485,816 ක් ලෙස සටහන් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වූ තැන්පතු ලැබීම් සහ ගෙවීම් වටිනාකම් නිසිපරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ සඳහන් කල යුතුය. | ආදායමෙන් ආපසු ගෙවීම් දැක්වීමට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම දක්වා නොතිබූ නිසා තැන්පතු ගෙවීම් යටතේම ආදායමෙන් ආපසු ගෙවීම් ප්‍රමාණය පෙන්වා ඇත. |

### 1.6.3 අග්‍රිම ශේෂය

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | ----------------------------- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි 2019 දෙසැම්බර් 31 දිනට අවාසිදායක අග්‍රිම ශේෂය රු.89,209,564,017 විය යුතු වුවත් එය රු.89,289,260,205 ක අවාසිදායක ශේෂයක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කල යුතු වේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් වල නිරූපනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.6.4 අක් මුදල් ගැලැපුම් ගිණුම

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් සහ අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අතර අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් අතර වෙනස වූ රු.12,875,249 ක වටිනාකම අක්මුදල් ගැලපුම් ගිණුමට ගෙන නොතිබුණි. | මුළු අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් අතර වෙනස අක් මුදල් ගැලපුම් ගිණුමට ගිණුම්ගත කල යුතු වේ. | ඉදිරියේදී අත්තිකාරම් ගිණුමේ මුළු ලැබීම් හා ගෙවීම් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ අතුලත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වූ තැන්පතු ලැබීම් සහ ගෙවීම් පිළිවෙලින් රු.1,351,646,095 ක් සහ රු.1,371,636,310 ක් විය. එහෙත් භාණ්ඩාගාර පොත් අනුව එය පිළිවෙලින් රු.1,373,147,081 ක් සහ රු.1,617,026,030 ක් වී තිබුණි. ඒ අනුව අක් මුදල් ගැලපුම් ගිණුමේ එම වෙනස පිළිවෙලින් රු. 21,500,986 ක් බැර වශයෙන් ද, රු. 245,389,720 ක් හර වශයෙන්ද ගැළපිය යුතුව තිබුණත්, එය පිළිවෙලින් රු.290,306,013 ක් සහ රු.233,366 ක් වශයෙන් ගැළපීම් කර තිබුණි. | මාසික ගිණුම් සාරාංශ මඟින් තැන්පතු ලැබීම් හා ගෙවීම් සන්සන්දනය කර වටිනාකම නිවැරදි කල යුතු අතර අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අදාල වටිනාකම් සඳහන් කල යුතුය. | භාණ්ඩාගාර පොත් සහ අමාත්‍යාංශ පොත් අතර තැන්පතු ලැබීම් හා ගෙවීම් වෙනස රු.223,888,734 ක් වුවද අක් මුදල් ගැලපුම් ගිණුමෙහි රු.290,072,647 ක් ලෙස සටහන් කිරීම නිවැරදිය . |

## 1.6.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහාමාර්ග අංශයට අදාලව ස්ථාන මාරුවීම්, සේවය අතහැර යාම හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අය කර ගෙන නොතිබූ වසර 25 ක වැඩි ණය ශේෂවල එකතු වටිනාකම රු. 267,841 ක් විය. | 2004 ඔක්තෝම්බර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ස්ථාන මාරු වී ගිය දැනට නිරවුල් නොවී පවතින ණය ශේෂ 03 සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු සොයා ගැනීමට අපහසු අතර කෙසේ වුවද ඉදිරියේ දී එම ණය මුදල් අය කරගැනීමට හෝ මාරු පත්‍ර මඟින් නිවැරදි කිරීම් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

### 1.6.6 තැන්පතු

---------

මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා, අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කිරීම හෝ ඉක්මණින් ආපසු ගෙවීම සිදු කළයුතු වුවත් පහත සඳහන් අවස්ථාවලදී එසේ සිදු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයට අදාල හිටපු අමාත්‍යවරයෙකු වෙත නිකුත් කරන ලද වට්ටෝරු භාණ්ඩ නැවත භාර නොදීම නිසා, අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්ගේ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් ප්‍රදානය වන රු.233,366 ක මුදල 2015 දෙසැම්බර් 17 වන දින සිට පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කාල පමාවකින් තොරව නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට පියවර ගත්තද අවසන් තීරණයක් ලබා ගැනීමට නොහැකි වී ඇත. |
| (ආ) | මහාමාර්ග අංශයට අදාලව සුනාමි බලපෑමට ලක්වූ ප්‍රදේශයක් වූ ත්‍රිකුණාමලය පුල්මුඩේ මාර්ගයේ පාලමක් ඉදිකිරීම වෙනුවෙන් ලද රු.මිලියන 88.23 ක මුදලක් අදාල කාර්යය ඉටුනොකර 2016 මාර්තු 31 දින සිට පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කාල පමාවකින් තොරව නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | මෙම මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කර විගණනයට වාර්තා කරන බව දන්වමි. |
| (ඇ) | 2011 අප්‍රේල් 01 දින සිට හානිවූ මාර්ග ප්‍රතිස්ථාපනය සඳහා රඳවාගෙන තිබූ රු.මිලියන 5.7 ක තැන්පතු අදාල කාර්ය ඉටුනොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කාල පමාවකින් තොරව නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | මෙම මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කර විගණනයට වාර්තා කරන බව දන්වමි. |

## 1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැබිය යුතු නිළධාරීන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අංශයට අදාලව ඉදිරියේ දී ඇප ලේඛනයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත. |

## 1.6.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නිරීක්ෂණය | | | |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල් රෙගුලාසි අංක 104(3) | අමාත්‍යාංශයට අයත් මහාමාර්ග අංශයේ සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබූ සියළුම වාහන අනතුරුවල ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කිරීමට දින 09 ත් මාස 04 ත් අතර කාලයක් ගතවී තිබූ අතර වාහන 3 ක අනතුරු සඳහා ප්‍රාරම්භක වාර්තාවක් හෝ ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ 2019 වර්ෂය තුළ සිදුවී තිබූ වාහන අනතුරු 08 න් අනතුරු 04 ක් සිදුවී වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද අදාළ ප්‍රාරම්භක වාර්තා 2019 දෙසැම්බර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුවේ. | මු. රෙ. 104(3) අනුව, ප්‍රාරම්භක වාර්තා නියමිත කාලය තුල ඉදිරිපත් කිරිමට ප්‍රමාදවී ඇති වාහන බොහෝමයක්, ගරු අමාත්‍යතුමාගේ කාර්යමණ්ඩලයට අනුයුක්තකර ඇති වාහන වන අතර ඒවා පවතිනුයේ කොළඹ ප්‍රදේශයෙන් දුර බැහැර බැවින් එම වාහන පරික්ෂණ කටයුතු සඳහා ගෙන්වා ගැනීමේ අපහසුතා වැනි හේතු නිසා මෙම ප්‍රමාදයන් සිදුවී ඇත. එහෙත් මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයට අයත් වාහනවලට 2019 වර්ෂයේ සිදුවූ අනතුරුවලින් එක් අනතුරකට අදාළ ප්‍රාරම්භක වාර්තාවක් හැර අනෙකුත් සියලු ප්‍රාරම්භක වාර්තා 2019 වර්ෂය අවසන්වීමට පෙර ඉදිරිපත් කර ඇත. අනෙක් අනතුරට අදාළ ප්‍රාරම්භක |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වාර්තාවේ කටයුතුද මේ වනවිට සිදුකෙරෙමින් පවතී. අනතුරක් සිදුවී හානි පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් දින 07 ක් ඇතුළත විය නොහැකි නම් ප්‍රාරම්භක වාර්තාවක් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරන ලෙස ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| (ii) | අංක 104(4) | වාහන අනතුරු පිළිබඳ පූර්ණ වාර්තාවක් අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත් වර්ෂය තුළ මහාමාර්ග අංශයේ සිදුවූ අනතුරු 11 ක් සම්බන්ධයෙන් සහ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ සිදුවූ අනතුරු 04 ක් සම්බන්ධයෙන් අදාළ පූර්ණ වාර්තා 2019 දෙසැම්බර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුවේ. | හැකි ඉක්මණින් අවශ්‍ය වාර්තා ලබාගෙන විගණකාධිපති වෙත යොමු කරන ලෙස නිලධාරීන්ට උපදෙස්දී ඇත. |
| (ආ) | 2019 අගෝස්තු 20 දිනැති අංක EC/EDR/01/2019 දරන මැතිවරණ කොමිෂන් සභා සභාපතිගේ චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 128 (1) (එ) | මැතිවරණ කාලසීමාවේ දී හා ඡන්ද විමසීම් නිවේදනයට පූර්වාසන්නයෙන් වූ කාලසීමාව තුළ මහජන මුදල් අධික ලෙස වැය කරමින් විවිධ ව්‍යාපෘති හෝ වෙනත් සංවර්ධන කටයුතු පිළිබඳව හෝ කාරණා සම්බන්ධයෙන් ප්‍රචාරක දැන්වීම් මුද්‍රිතව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රකාශයන් නොකළ යුතු නමුත් ඊට පටහැනිව ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු. 5,553,154 ක වියදමක් දරා තිබුණි. | 2019 අගෝස්තු 20 දිනැති අංක EC/EDR/01/2019 දරන මැතිවරණ කොමිෂන් සභා සභාපතිගේ චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 128 (1) (එ) වලට අනුකූලව කටයුතු කල යුතුවේ. | ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණ කටයුතු සඳහා මන්නාරම් හා කාවේරි ද්‍රෝණියේ ගුවන්ගතව චුම්බක හා ගුරුත්වාකර්ෂණ දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම මෙරට ඛනිජතෙල් කර්මාන්තයේ සුවිශේෂී අවස්ථාවක් ලෙස සලකා අදාළ පුවත්පත්දැන්වීම් මගින් ජනතාව දැනුවත් කිරිම සිදුකරඇත. මෙවන් කටයුතු සිදුකරනවිටදී රටේ පවතින වාතාවරණය පිළිබඳව සැලකිලිමත්වීමේ වැදගත්කම නිලධාරීන්ට පහදා දෙන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් හඳුන්වා දී නොතිබූ අතර අදාළ ප්‍රඥප්ති පිළියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | මහාමාර්ග අංශයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස්කිරීම පාලන අංශය මඟින් ආරම්භ කර ඇති අතර සියලු අංශවලින් ඒ සඳහා යෝජනා කැඳවා ඇත. බණිජතෙල් සම්පත් සංවර්ධන අංශය සඳහා මානව සම්පත් සංවර්ධනය සඳනා සැලසුම් සකස්කිරීම මේ වනවිට සිදුකරමින් පවතී. |
| (ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ඇ) ඡේදය | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ "වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම" පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ඔබ විසින් පෙන්වාදී ඇති පරිදි අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ඇතුලත් කර නොමැති බව පිළිගන්නා අතර 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී එම කරුණු ඇතුලත් කර ඇත. |
| (ඉ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | 2018 වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නියමිත කාල වකවානු තුළ සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය අවසන් කර වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | -------------------------------- |
| (අ) | 2018 ඔක්තෝබර් 25 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් නැව්තෙල් ව්‍යාපාරයේ නියැලෙන ව්‍යාපාරිකයන්ගෙන් දැනට අයකරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව 2019 වර්ෂයේ සිට | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සංශෝධිත ආදායම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | අතපසුවීමක් නිසා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව 2019 වර්ෂය සඳහා සකස් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ඇමෙරිකානු ඩොලර් 1,000 සිට ඇමෙරිකානු ඩොලර් 5,000 දක්වා ඉහළ දැමීමට ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය වෙත අනුමැතිය ලබා දී තිබුණි. මුදල් රෙගුලාසි 85 (2) (ආ) ප්‍රකාරව මෙන්ම 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව කිසියම් සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ හේතු සහ කළ යුතු සංශෝධන පිළිබඳව රාජ්‍ය මූල්‍ය ප්රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතු නමුත් එසේ වාර්තා කර නොතිබුණි. එමෙන්ම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය විසින් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණ බැවින් ආදායම් ඇස්තමේන්තුව හා රැස්කළ ආදායම අතර රු. 31,418,859 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුව වූ රු.92,000,000 සමඟ සැසඳීමේ දී සියයට 34 ක් විය. | | |
| (ආ) | 2018 වර්ෂය තුළ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය විසින් රු.2,000,000 ක් වූ හිඟ ආදායම්, අතහැර තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 113 (3) (ආ) හා (ඇ) ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අවසරය ද ලබා ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අත්හැරීම් සඳහා මුදල් රෙගුලාසි 113(3) (ආ) හා (ඇ) ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුය. | 2018 වර්ෂය තුළ රු .2,000,000 ක් වූ හිඟ ආදායම් අත්හැරීමට අනුමැතිය ලබාගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම් වෙත 2019.12.03 දින ලිපියක් යොමුකර ඇත. නමුත් පිළිතුරක් ලබාදී නැති බැවින් නැවත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකර ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

-------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබාගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ---------- | ---------------------------- |
| (අ) | මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීමට වග බලාගත යුතුවේ. එහෙත් නිසි ඇගයීමකින් හා සැලසුම් කිරීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ප්‍රතිපාදන මාරුකිරීම හේතුවෙන් අමාත්‍යාංශයේ වැය විෂයයන් 07 කට අදාලව ලබාදී තිබූ රු.මිලියන 10.5 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කිසිදු උපයෝජනයක් නොකර ඉතිරි කර තිබුණි. | නිසි ඇගයීමකින් හා ක්‍රමවත් අධ්‍යයනයකින් යථාවාදීව ඇස්තමේන්තු පිළියෙල කිරීමට ක්‍රියා කල යුතුය. | අපේක්ෂිත වාහන සහ යන්ත්‍ර අළුත්වැඩියා සිදු නොකිරීම සහ උපකරණ මිලට ගැනීම සිදුනොකිරීම හේතු කොට ගෙන වැය විෂයන් වෙත ඇස්තමේන්තු මගින් හා මු.රෙ 66. යටතේ මාරු කිරීම මගින් ලබා දී තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කල නොහැකි වූ බැවින් ඉතිරි විය. |
| (ආ) | වැය විෂයකට අදාලව වෙන් කර ඇති ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී පමණක් පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබාගත යුතු වුවත් නිසි ඇගයීමකින් තොරව පරිපූරක ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් වැය විෂයයන් 03 කට අදාලව පරිපූරක ප්‍රතිපාදන මඟින් අනුමත කරවාගෙන තිබූ එකතු වටිනාකම රු.මිලියන 15,696 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිවී තිබුණි. වැය විෂයයන් 06 කට අදාලව පරිපූරක ප්‍රතිපාදන සියයට 70 ත් සියයට 90 ත් අතර උපයෝජනයකින් තොරව ඉතිරිවී තිබුණි. තවද, එක් වැය විෂයකට අදාලව රු.මිලියන 225 ක පරිපූරක ප්‍රතිපාදන මුළුමනින්ම වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. | අයවැය ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවන බවට නිසි ඇගයීමක් සිදුකිරීම තුළින් පමණක් පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | ගෙවීම් කරන ලද IPC ගිණුම් ගත නොවීම, කාලගුණ තත්වයන් අයහපත් වීම නිසා පුපුරණද්‍රව්‍ය නිකුත් කිරීම සීමා කිරිම, ගෙවීම් කරන ලද අතුරු ගෙවීම් සහතිකපත් ගිණුම් ගත නොවීම, අපේක්ෂිත පරිදි වියදම් ජනිත නොවීම සහ අතැති බිල්පත් සඳහා ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම නිසා පරිපූරක මගින් අනුමත කර ගන්නා ලද ප්‍රතිපාදන මුළුමනින්ම හා 70% ත් 90% ත් අතර ඉතිරිවීම් වාර්තා වී ඇත. |
| (ඇ) | අමාත්‍යාංශය මඟින් අයවැය ප්‍රතිපාදන සලසාගෙන තිබූ වැය විෂයයන් 11 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 9,166.7 ක ප්‍රතිපාදන එකී වැය විෂයය සඳහා කිසිඳු වියදමක් නොදරා සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසි | නිවැරදිව හඳුනාගත් වියදම් අවශ්‍යතාවයන්ට පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කල යුතුය. | හදිසි අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම, වර්ෂය තුල අපේක්ෂිත වියදම් පැන නොනැගීම, විදේශ ගමන් සීමා කිරීම, රාජ්‍ය ඇමතිතුමා නිල නිවාස ලබා නොගැනීම, ණය ගිවිසුම් අත්සන් නොකිරීම යනාදි |

| | | | |
|---|---|---|---|
| | 66/69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | | හේතු නිසා මුදල් රෙගුලාසි 66 69/ මගින් වෙනත් වැය විෂයන් වෙත මාරු කිරීමට හේතු විය. |
| (ඇ) | එකතු වටිනාකම රු.මිලියන 168,567.2 ක ශුද්ධ ප්‍රතිපාදන සලසාගෙන තිබූ වැය විෂයයන් 72 කට අදාලව නිසි පුරෝකථනයකින් තොරව ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් සියයට 25 සිට සියයට 99 දක්වා පරාසයක විහිදුනු එකතු වටිනාකම රු.මිලියන 100,347.3 ක ශුද්ධ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | නිසි පුරෝකථනයකින් යුක්තව වැය ඇස්තමේන්තු සැකසිය යුතුය. | අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම, වියදම් පාලනය කිරීම, අළුත්වැඩියා පිරිවැය දැරීමට සිදු නොවීම, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම, අතිකාල ගෙවීම් සීමිත වීම, නිළධාරීන්ගේ හිඟය, දේශීය සංචාරයන්ගේ සීමාකිරීම, විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගීත්වය සීමා වීම, නිල ඇඳුම් දීමනාව සඳහා සුදුසුකම් ලද නිලධාරීන් සංඛ්‍යාව සීමා වීම, වාහන නඩත්තු පිරිවැය සීමා කිරීම, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් අඩු කිරීම, ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ මිලට නොගැනීම, අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් නොවීම, සීසීටීවී පද්ධතියේ සහ ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතිය සඳහා අපේක්ෂිත පරිදි වියදම් ජනිත නොවීම, පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම සීමා කිරීම, ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම යනාදී හේතු නිසා වැය විෂයන් 72 කට අදාලව 25%-99% දක්වා ඉතිරිවීම් සිදු වී තිබුණි. |
| (ඉ) | අමාත්‍යාංශය විසින් ඉදිරි වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා හේතුවෙන් මූලික වියදම් ඇස්තමේන්තු හා සංශෝධන වියදම් ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 25 සිට සියයට 900 ක් දක්වා පරාසයක පැවතුණි. | නිතිපතා සංශෝධනයන්ට ලක් නොවන සේ වර්ෂයේ වියදම් ඇස්තමේන්තු නිසි පුරෝකථනයකින් යුක්තව සැකසිය යුතුය. | 2019 වර්ෂයේ ඇස්තමේන්තු අවශ්‍යතාවය සඳහා විවිධ ගෙවීම් ඒකක විසින් ඉදිරිපත් කරන ලද බිලියන 522 ක අවශ්‍යතාවය රු.බිලියන 280කට සීමා කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කල පසු උපරිම සීමාව බිලියන 175ක් දක්වා කෙටුම්පත් කර ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදුණි . ඒ අනුව රු.බිලියන 175ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලැබුණි .<br>උක්ත ප්‍රතිපාදන මගින් 2018වර්ෂයේ නිරවුල් කරන ලද බැඳීම් බිලියන 55 කට ආසන්න ප්‍රමාණයක් නිරවුල් කිරීමට පැවතිණි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වැය විෂයයන් 12 කට අදාලව මුදල් රෙගුලාසි 66/69 මාරුකිරීම් යටතේ සලසාගෙන තිබූ රු.මිලියන 5,076.6 ක එකතු වටිනාකමකින් යුත් අතිරේක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | නිවැරදිව හඳුනාගත් වියදම් අවශ්‍යතාවයන්ට පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කල යුතුය. | මුදල් රෙගුලාසි 69/66මාරු කිරීම් යටතේ සලසා ගෙන තිබූ අතිරේක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ඉතිරිවිමට, අපේක්ෂිත නොවූ පරිදි අතිකාල කිරීම සීමා වීම, පවත්වනු ලබන රැස්වීම් සීමා කිරීම හේතුවෙන් බලාපොරොත්තු වූ පරිදි වියදම් ජනිත නොවීම, ගෙවීම් කරන ලද IPC ගිණුම් ගත නොවීම, ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම, බලාපොරොත්තු වූ වියදම් ජනිත නොවීම, සිවිල් වැඩ සහ උපදේශන සේවා සඳහා බදු නිදහස් කිරීම යනාදී කරුණු හේතු වී තිබුණි. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

---------------------------------

පහත නිරික්ෂණය කරනු ලැබේ

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|
| මු.රෙ.214 ප්‍රකාරව බැරකම් ලේඛන නිතිපතා පරීක්ෂා කොට නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට නොපියවූ බැඳීම් හා බැරකම්වල එකතුව රු.මිලියන 40,465 ක් විය. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව කටයුතු කල යුතුය. | බැරකම් ලේඛණය නිතිපතා පරීක්ෂාකර නිරවුල් කිරීමට කටයුතු කලත් වාර්ෂික ඇස්තමේන්තු වලින් ලබා දෙන ප්‍රතිපාදන සීමා සහිත වීම නිසා රු .මිලියන 40,465ක බැරකම් පැවතිණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 සැලැසුම් කිරීම

----------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස්කිරීමේදී ව්‍යාපෘතීන්ට අදාලව ප්‍රායෝගිකව ලඟාකරගැනීමට අසීරු ඉලක්කයන් නිර්ණය කර තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස්කිරීමේදී ප්‍රායෝගිකව ලඟාකරගත හැකි ඉලක්කයන් නිර්ණය කල | මහාමාර්ග අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලින් බහුතරය විදේශ ආධාර ව්‍යාපෘති වන අතර එම ව්‍යාපෘති අදාල කාලය තුළදී නිම කළ |

| | | |
|---|---|---|
| තවද, 2019 වර්ෂයේ ඇස්තමේන්තුවේ සඳහන් මූල්‍ය වෙන්කිරීම් පිළිබඳ නොසලකා අයවැය වෙන්කිරීම් ලෙස වෙනත් අගයන් යොදා තිබුණි. | යුතුවේ. | යුතුය. එබැවින් ව්‍යාපෘති නිම කිරීමට නියමිත වන කාලය සමඟ සසඳා ප්‍රායෝගිකව ළඟා කර ගතහැකි වන භෞතික ඉලක්ක සකසන අතර නීතිමය ගැටළු, ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියේ ඇතිවන ගැටළුකාරී තත්ත්වයන් හා අක්මුදල් ඌණතා වැනි සාධක වල බලපෑමෙන් අපේක්ෂිත භෞතික ඉලක්ක සපුරා ගැනීමට බාධා ඇති වේ.<br>ඉදිරි වර්ෂය සඳහා සකසනු ලබන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බැවින් 2019 වර්ෂය සඳහා සකසන ලද ක්‍රියාකාරී සැලැස්ම 2018.12.28 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 5) ඒ වන විට 2019 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මුදල් අමාත්‍යාංශය වෙතින් සකසා අවසන් කොට නොතිබූ බැවින්, අපේක්ෂිත ඇස්තමේන්තුව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරන ලදී. ඉන් අනතුරුව 2019.01.03 දින 2019 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් සඳහා සකසන ලද අතුරු සම්මත ගිණුම සකසා මෙම අමාත්‍යාංශය වෙත එවා තිබූ අතර අතුරු සම්මත ගිණුමේ සඳහන් මූල්‍ය වෙන් කිරීම් අයවැය වෙන්කිරීම් ලෙස වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කිරීමට අවස්ථාවක් නොලැබුණි. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයට අදාලව ක්‍රියාකාරි සැලැස්මේ අඩංගු ක්‍රියාකාරකම් 07 ක් අතුරින් රු. මිලියන 50 ක ඇස්තමේන්තු වෙන් කිරීම් සහිත ක්‍රියාකාරකම් 05 ක් 2019 දෙසැම්බර් 31 වන දින වන විටත් ආරම්භ කර නොතිබුණි. තවද රු.මිලියන 10 ක ඇස්තමේන්තු වෙන් කිරීම් සහිත ක්‍රියාකාරකම් 02 ක් සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළ අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. | අදාල වර්ෂය තුලදී ඉටුකිරීමට යෝජිත කාර්යයන් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඉලක්ක සපුරාගැනීමට කටයුතු කල යුතුවීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගතවීම , නීතිමය තත්ත්වයන් පිළිබඳව විමසීම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගැනීමට සිදුවීම ,ඉදිකිරීම් කටයුතු සඳහා කාලගුණික වෙනස්වීම්වලින් බාධා ඇතිවීම ,වෙනත් අදාළ ආයතන වෙතින් අනුමැතිය ලබාගැනීමට සිදුවීම වැනි හේතු නිසා මෙම ව්‍යාපෘති නියමිත කාලය තුළ අවසන් කිරීමට නොහැකි වී ඇත. |
| (ආ) | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ පාලන, සංවර්ධන, ප්‍රසම්පාදන, මූල්‍ය හා අභ්‍යන්තර විගණන යන අංශ ආවරණය වන පරිදි පිළියෙල කර තිබූ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 35 ක් අතුරින් ක්‍රියාකාරකම් 05 ක් අවසන් කර නොතිබුණි. | අදාල වර්ෂය තුලදී ඉටුකිරීමට යෝජිත කාර්යයන් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඉලක්ක සපුරාගැනීමට කටයුතු කල යුතුවීම. | 2019.12.31 දින වන විට අවසන් කිරීමට අපේක්ෂා කළ නමුත් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ඒ පිළිබඳ නීතිමය පැහැදිළි කිරීම් සිදුකර ගැනීමට වැඩි කාලයක් ගතවීම හේතුවෙන් මෙම ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වී ඇත . |

## 3.3 අමාත්‍යාංශයේ අරමුණු ප්‍රකාරව කටයුතු නොකිරීම

--------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉන්ධන අලෙවි කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් 1461 ක් පැවති අතර ඉන් ඉන්ධන පිරවුම්හල් 1254 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට හා ඉතිරි ඉන්ධන පිරවුම්හල් 207 ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත්ව තිබුණි. මෙම ඉන්ධන පිරවුම්හල් වල | අදාල අරමුණු ඉටුකරගැනීම සඳහා අදාල ප්‍රතිපත්ති වැඩසටහන්, ව්‍යාපෘති සම්පාදනය, පසුවිපරම් කිරීම හා ඇගයීම ඵලදායී අයුරින් සිදුකල යුතුවේ. | ඉන්ධන සැපයුමෙහි ගුණාත්මක තත්ත්වය හා විශ්වාසනීයත්වය දියුණු කිරීම යන කාරණය යටතේ ඛනිජ තෙල්වල ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම /සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්ෂණික ආයතනය හා මහජන උපයෝගීතා කොමිසම යන ආයතන තුන හා එක්ව |

| | | |
|---|---|---|
| කටයුතු සොයා බැලීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ විශේෂ අධීක්ෂණ කණ්ඩායමක් යොදා තිබූ අතර එම කණ්ඩායම විසින් ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල් 1461 අතුරින් ඉන්ධන පිරවුම්හල් 73 ක් පරීක්ෂා කර තිබුණි. ඉන් පිරවුම්හල් 28 ක් හෙවත් සියයට 38 ක් දුර්වල තත්ත්වයක පැවතුණි. තවද, 2018 වර්ෂය තුළ ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් පිරවුම්හල් 207 ක් අතුරින් 03 ක් පමණක් භෞතිකව පරීක්ෂා කර තිබූ අතර ඉන් පිරවුම්හල් 02 ක් සාමාන්‍ය තත්ත්වයේ හා දුර්වල තත්ත්වයේ පැවතුණි. විගණනය මඟින් ගම්පහ හා ගාල්ල දිස්ත්‍රික්කවල ඉන්ධන පිරවුම්හල් 24 ක් සම්බන්ධව සිදු කළ භෞතික පරීක්ෂාවේ දී එයින් ඉන්ධන පිරවුම්හල් 21 කම ඉන්ධන සැපයුම් සේවාවේ ප්‍රමාණාත්මක අඩුපාඩු පැවතුණි. | | මෙම අමාත්‍යාංශය විසින් කටයුතු සිදුකරමින් පවතී .එසේම, ඉන්ධන පිරවුම්හල් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වඩාත් ඵලදායී වැඩසටහනක් සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කරමින් පවතී. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මාර්ග නඩත්තු භාරකාර අරමුදල මඟින් ජාතික මහාමාර්ග කි.මී.12,220 ක්, පාලම් 4,660 කට ආසන්න ප්‍රමාණයක් සහ ගුවන් පාලම් 12 ක සාමාන්‍ය නඩත්තු කටයුතු, කාලානුරූප නඩත්තු කටයුතු, ව්‍යුහාත්මක ඉදිකිරීම් නඩත්තු කටයුතු, සංඥා ලාම්පු නඩත්තු කටයුතු සහ හදිසි වැඩ යන වැඩ විෂයයන් සියයට 100 ක භෞතික ඉලක්කයක් ලඟාකර ගැනීමට සැලසුම් කර තිබුණි. නමුත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරී කාර්යාල යටතේ පවතින එම නඩත්තු කටයුතුවලින් සමාලෝචිත වර්ෂය තුළදී නඩත්තු කර තිබුණේ | වර්ෂය තුළදී නඩත්තු කිරීමට අපේක්ෂිත මාර්ග වර්ගීකරණය කර නිශ්චිතව හඳුනාගත යුතුවේ. | මාර්ග සහ පාලම් නඩත්තු භාර අරමුදල යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සහ පාලම් නඩත්තු කටයුතු සමස්ත ජාතික මාර්ග ජාලය සඳහාම එකවර සිදු කිරීම අවශ්‍ය නොවන අතර වසර තුළදී නඩත්තු කටයුතු සිදු කිරීමට අවශ්‍ය වන මාර්ග දුර ප්‍රමාණයන් සහ පාලම් ප්‍රමාණය ප්‍රමුඛතා පදනම හා ප්‍රතිපාදන වෙන් කිරීම් අනුව තීරණය වේ. |

| | | | |
|---|---|---|---|
| | පළාත් 9 ක් ආවරණය කරමින් කි.මී.357.63 ක් පමණකි. | | |
| (ආ) | රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 500 ක අයවැය ප්‍රතිපාදනයක් සිදු කර තිබූ බව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබුණද භෞතික ප්‍රගතිය පිළිබඳ ඉලක්ක සඳහන් කර නොතිබුණි. තවද, 2019 වාර්ෂික ඇස්තමේන්තුව අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සිදුකර තිබූ ප්‍රතිපාදනය රු.මිලියන 50 ක් පමණක් බව නිරීක්ෂණය වූ අතර ඉන් රු.මිලියන 14 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල ඉලක්කගත භෞතික ප්‍රගතිය සඳහන් කල යුතුවේ. | රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවිය යුතු මූලික අත්තිකාරම් මුදල් ගෙවීම 2019 වසරේ සිව්වන කාර්තුවේදී සිදු කිරීමට ඉලක්ක කොට තිබූ නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී එම මුදල් ප්‍රමාණයද සලකා බලා මූල්‍ය ඉලක්ක ලෙස රු.මි 500.යොදා තිබිණි .නමුත් ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙහි සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් අපේක්ෂිත ගෙවීම් කටයුතු සිදු නොවුනු නිසා මූල්‍ය උපයෝජනය ඵලදායී කර ගැනීම සඳහා මූල්‍ය අවශ්‍යතා පැවති වෙනත් ව්‍යාපෘති සඳහා එම මුදල් මාරු කිරීම සිදු විය. |
| (ඇ) | නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කුළුණු මත ඉදිවන මාර්ග ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයට අදාලව ඉදිකිරීම් කටයුතු සඳහා ක්‍රියාකාරී සැලැස්ම තුල ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණ අතර සියයට 20 ක භෞතික ප්‍රගතියක් ඉලක්කගත කර තිබුණි. වාර්ෂික ඇස්තමේන්තුව අනුව රු.මිලියන 125 ක් වෙන් කර තිබුණත් වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව ලඟා කර ගත් භෞතික ප්‍රගතියක් සඳහන් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධනය ඇගයීමේදී, ඉලක්කගත භෞතික ප්‍රගතියෙහි ළඟාකර ගැනීමද ඇගයීමට ලක්විය යුතුය. | නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක ලෙස 20% යොදා තිබුණේ නිර්මාණ කටයුතු සහ ඉදිකිරීම් යන ක්‍රියාකාරකම් 02 ම සඳහාය. මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසු ආයෝජකයෙකු නිර්ණය කිරීමේදී ඇති වූ ප්‍රායෝගික ගැටළු කරණ කොට සැලසුම් කළ පරිදි නිර්මාණ කටයුතු හෝ ඉදිකිරීම් කටයුතු සිදු නොවුණි. |
| (ඇ) | කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීම තුළින් නාගරික ප්‍රදේශයන්හි මාර්ග තදබදය අවම කිරීමේ අරමුණ ඇතිව ආරම්භ කරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිසංස්කරණය කටයුතු සිදුකල ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පළමු අදියර ඉලක්කගත ප්‍රගතිය සියයට 45 වුවත් සත්‍ය ප්‍රගතිය | ඉලක්කගත භෞතික ප්‍රගතිය ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතු වීම. | කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක වන මාර්ගයන් සියල්ලෙහිම භෞතික ඉලක්ක සැලසුම් කල පරිදි 100% ක අත්කරගැනීමට නොහැකි වීමට බලපෑ ප්‍රධානතම හේතුව වූයේ ඉඩම් අත්පත් කර ගැනීමේ |

| | | |
|---|---|---|
| සියයට 29 ක් විය. ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ දෙවන අදියර ඉලක්කගත ප්‍රගතිය සියයට 10 වුවද සත්‍ය ප්‍රගතිය සියයට 0.2 කි. කෝට්ටේ - බෝපේ මාර්ගයේ ඉලක්කගත ප්‍රගතිය සියයට 34 වුවත් සත්‍ය ප්‍රගතිය සියයට 25 ක් ද, කොට්ටාව තලගල මාර්ගයේ ඉලක්කගත ප්‍රගතිය සියයට 49 වුවත් සත්‍ය ප්‍රගතිය සියයට 29 ක් විය. නාවින්න - බොරලැස්ගමුව මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක නොකිරීමටද තීරණය කර තිබුණි. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි. | | ක්‍රියාවලිය තුල සිදු වූ ප්‍රමාදයන් සහ ගැටළුකාරී ස්වභාවයයි. |

## 3.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2004 වර්ෂයේ සිට ඛනිජතෙල් කර්මාන්තය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක් නොමැති වීම නිසා ඛනිජතෙල් කර්මාන්තය ද, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ නියාමනයට ලක් කෙරෙන කර්මාන්ත අතරට ඇතුළත් කිරීම සඳහා 2006 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගෙන තිබුණි. ඒ අනුව කර්මාන්තය නියාමනයට අවශ්‍ය මෙවලම් මහජන උපයෝගිතා කොමිෂන් සභාවට සපයා දීම සඳහා 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත යන පනත් දෙක සංශෝධනය කිරීමට අදාළ | අදාල පනත් සංශෝධනය කර අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය. | වර්තමාන විෂයභාර අමාත්‍යවරයා සමග මෙම පනත් කෙටුම්පත් සංශෝධනය සම්බන්ධව සාකච්ඡා සිදුකර ඇති අතර මේ පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදුකර ඇත. ඒ අනුව 2002 අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා සකස්කල කෙටුම්පත සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2012 වර්ෂයේ ලබාගෙන ඇති බැවින් ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේනතුව වෙතින් නැවත තහවුරු කර ගැනීමක් සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | මූලික කටයුතු 2006 වර්ෂයේ දී ආරම්භ කර තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. | | |
| (ආ) | 2015 සැප්තැම්බර් 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයක් මඟින් ස්වාභාවික ගෑස් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත බලය ලබා දී තිබුණි. මෙම ජාතික වායු ප්‍රතිපත්තිය 2018 ජූනි මාසය වන විට සකස් කර අවසන් කිරීමට සැලැසුම් කර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | අදාල ප්‍රතිපත්ති අනුමත කර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. | මෙම ජාතික වායු ප්‍රතිපත්තිය 2019.12.28 දින නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එහිදී ලබා දෙන ලද තීරණ අංක අමප.20/0234/226/015 පරිදි එම ප්‍රතිපත්තිය නැවත විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කරන ලදී. ඉන් අනතුරුව එම කමිටුව මගින් මෙම ජාතික ප්‍රතිපත්තිය නැවත අධ්‍යනය කරමින් පවති. එම 8 වාර්තාව ලැබුණු පසු මෙය නැවත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල හැකිවේ. |
| (ඇ) | ත්‍රිකුණාමලය වරාය තුළ 1930 වර්ෂයේ සිට ස්ථාපිත කර තිබූ තෙල් ටැංකි පද්ධතිය ද්‍රව ඝණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. දැනට ඉතිරිව ඇති මුළු ටැංකි 99 කින් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 දින ආරම්භ කර තිබුණ ද, ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කර නොතිබුණි. | නඩු තීන්දු මත ඉදිරි කටයුතු කඩිනමින් කිරීමට කටයුතු කල යුතුය. | දැනට තෙල් ටැංකි සංකීර්ණයේ ඉහළ කොටසේ තිබෙන ටැංකි 85 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඉන්දියානු තෙල් සමාගම මගින් සංවර්ධනය කිරීම සඳහා සමාගමක් පිහිටුවීමේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හා ලංකා ඉන්දියානු තෙල් සමාගම යන ආයතනවලට එම සමාගමේ කොටස් මිලදී ගැනීමට හැකිවන පරිදි එම සමාගම පිහිටුවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත දන්වා ඇත. එහෙත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පොදු සේවක වෘත්තීය සමිති මගින් සහ විධායක නිලධාරීන්ගේ වෘත්තීය සමිතිය මගින් මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා ඇත. |
| (ඈ) | කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව සතු භූමියේ පිහිටුවා තිබූ තෙල් තොග ගබඩාව නවීකරණය සඳහා 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. නමුත් ඛනිජතෙල් තොග ගබඩා | අදාල කටයුතු කඩිනමින් සිදුකර හිඟ මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | ඉඩමට අදාළ බදු ගිවිසුම සකස්කර ඉඩම බදුදීම සඳහා ප්‍රාදේශීය ලේකම්, තිලිප්පලේ වෙත ඉඩම් අමාත්‍යාංශය මගින් දන්වන ලදුව එම ඉඩමේ තක්සේරු වාර්තා සකස්කිරීම සඳහා මිනින්දෝරු සැලැස්ම ඉදිරිපත් කරන මෙන් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා |

| | | | |
|---|---|---|---|
| | පර්යන්ත සමාගම විසින් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු රු.මිලියන 142.98 ක හිඟ මුදල ගෙවා නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | | පර්යන්ත සමාගම වෙත දන්වා ඇත. |
| (ඉ) | ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කරගෙන දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) අතර 2015 සැප්තැම්බර් 30 දින ගිවිසුමකට ඇතුළත්වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 28 දින වන විට ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත්තු මිල වූ රු.37,165,183 ක් නාරා ආයතනය වෙත ගෙවා තිබුණි. නමුත් දත්ත පිළිබඳ නිසි අවබෝධයකින් තොරතුරු පද්ධතිය මෙහෙයවිය හැකි පුහුණු නිළධාරීන් නොමැතිවීම හා අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම දත්ත ඇතුළත් වෙබ් සර්වර් යන්ත්‍රය ඛණිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය තුල 2019 වර්ෂය අවසන් වන විටත්, ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි. | අදාල වෙබ් සර්වර් යන්ත්‍රය ඛණිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය තුල ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනම් කල යුතුය. | ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කරගෙන දීප ව්‍යාප්ත පාරිසරික දත්ත එකතු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වඩාත්ම යෝග්‍ය රාජ්‍ය ආයතනයක් වන ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය සමග එළඹෙන ලද ගිවිසුම් ප්‍රකාරව ඔවුන් විසින් එම කටයුත්ත සම්පූර්ණ කර අදාළ දත්ත පද්ධතිය ක්‍රියාත්මකව පවත්වාගෙන යනු ලැබේ. වෙබ් සර්වර් යන්ත්‍රය හා දත්ත පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා වෙනම උප ගිවිසුමකට එළඹීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ JS 5 සහ JS 6 බිම් කොටස්වල ගවේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශයේ ටොටාල් සමාගම, 2016 පෙබරවාරි 18 වන දින එළඹෙන ලද ඒකාබද්ධ ගවේෂණ ගිවිසුම අත්සන් කිරීමේදී, සපුරා තිබිය යුතු පූර්ව අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වී | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ශ්‍රී ලංකා රජය හා ප්‍රංශයේ ටොටාල් සමාගම හා මෙම ව්‍යාපෘතිය සඳහා 2016 පෙබරවාරි 18 වන දින එළඹෙන ලද ගිවිසුම ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පසුබිම සපුරා ගන්නා තුරු අදාළ ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද විය. මේ අනුව මෙම ගිවිසුමේ 3.1 වගන්තිය ප්‍රකාරව මෙම ගිවිසුම 2018 පෙබරවාරි 18 වන දින |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. එම නිසා 2019 අගෝස්තු 27 දින නැවත සංශෝධිත ඒකාබද්ධ ගිවිසුමකට ඇතුළත් වන තෙක් කලින් අත්සන් කරන ලද ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වී තිබුණි. | | අවසන් නොවිනි. ඒ අනුව 2019 අගෝස්තු මස 27 වන දින සංශෝධිත ඒකාබද්ධ ගිවිසුමට එළඹෙන තුරුම 2016 වසරේදී එළඹෙන ලද ගිවිසුම බලාත්මකව පැවතුණි. |
| (උ) | ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා බටහිර අක්වෙරළ තීරය ආශ්‍රිතව ද්වීමාන හා ත්‍රිමාන දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් මස 06 දින පැවති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මෙම ව්‍යාපෘතිය රටට ආර්ථික වශයෙන් විශේෂිත ව්‍යාපෘතියක් වන බැවින් ප්‍රමුඛතා පදනම මත කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ආර්ථික කළමනාකරණය සඳහා වූ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් උපදෙස් ලබා දී තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලද දිනයේ සිට ගිවිසුම අත්සන් කරන ලද දිනය වන 2018 මැයි 30 දක්වා වසර **1** ½ කට වැඩි කාලයක් ගත වී තිබුණි. | ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආශ්‍රිතව පවතින ඛනිජ සම්පත් හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීමට අවශ්‍ය තොරතුරු නොපමාව අදාල අංශ වෙත ලබා දීමට කටයුතු කළ යුතු වීම. | 2016 පෙබරවාරි මස 18 වන දින ශ්‍රී ලංකා ජනරජය ප්‍රංශ සමාගමක් වන TOTAL සමාගම අතර ශ්‍රී ලංකාවේ නැගෙනහිර අක්වෙරළ බිම් කොටස් 2 ක් වන JS5 සහ JS6 සඳහා ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමකට ඇතුළත්වී ඇත. මෙහි ප්‍රධාන අරමුණ වූයේ භූ විද්‍යාත්මක, භූ භෞතික, තාක්ෂණික විශ්ලේෂණයන්ගෙන් එක්රැස් කරගත් දත්ත විශ්ලේෂණය මගින් මෙම බිම් කොටස් දෙකෙහි ඇති ඛනිජ සම්පත් නිධි පිළිබඳ ගවේෂණ කටයුතු කිරීමයි. නමුත් මෙම ගිවිසුමෙහි 8 වන වගන්තිය ප්‍රකාරව මෙම ඒකාබද්ධ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා නව ද්වීමාන භූකම්පන දත්ත අවශ්‍ය වී ඇති නමුත් එම දත්ත නොමැතිව ගිවිසුමට එළඹ ඇත. |
| **(ඌ)** | මන්නාරම් ද්‍රෝණියේ M2 ගවේෂණ බිම් කොටසේ ඛනිජතෙල් ගවේෂණ කටයුතු සඳහා 2007 වසරේ දී සිදු කරන ලද ජාත්‍යන්තර ලංසු කැඳවීමේ වටයකින් පසු කෙයාර්න් ලංකා (පුද්ගලික) සමාගම තෝරා ගෙන තිබුණු අතර 2011 වසරේ දී සිදු කරන ලද කැණීම්වලින් ස්වාභාවික වායු නිධි දෙකක් සොයාගෙන තිබුණි. මෙම සමාගම මන්නාරම් ද්‍රෝණියේ ගවේෂණ කටයුතු අතරමඟ නවතා 2015 ඔක්තෝබර් 15 දින ගිවිසුම අවසන් කර තිබුණි. එතැන් සිට මෙම බිම් කොටසේ | ඛනිජ තෙල් ගවේශනය සිදු කිරීමට ප්‍රමුඛතාවය ලා සිදුකිරීමේ වැදගත්කම අදාල අංශ වෙත දැනුවත් කිරීම සිදුකළ යුතු වීම. | 2007 ලංසු වටයෙන් M2 බිම් කොටසේ ගවේෂණ කටයුතු සඳහා තෝරා පත් කරගන්නා ලද හෙයාර්න් ලංකා (පුද්ගලික) සමාගම එහි මව් සමාගම වන වෙදෙන්තා සමාගම විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත සිය ගවේෂණ කටයුතු නවතා දමන ලදී. මෙම ගවේෂණ කටයුතු සඳහා එම සමාගම් විසින් පිරිවැය දරනු ලබන බැවින් මෙවන් තත්වයන් ඇතිවීම වලක්වා ගැනීමට නොහැක. |

| | | | |
|---|---|---|---|
| | ගවේෂණ කටයුතු 2015 වසරේ සිට වසර 04 ක පමණ කාලයක් මුළුල්ලේ කිසිදු ප්‍රගතියක් අත් කර නොගෙන අතරමඟ නැවතී තිබුණි. | | |
| (එ) | මන්නාරම් ද්‍රෝණියේ M2 බිම් කොටසේ ගවේෂණ කටයුතු හා ස්වාභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂයේදී ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් අයි.එච්.එස්. ග්ලෝබල් සමාගම තෝරාගෙන තිබුණි. ඒ සඳහා 2016 දෙසැම්බර් සිට 2018 අගෝස්තු දක්වා අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 300,000 ක් එනම් ශ්‍රී ලංකා මුදලින් රු.46,610,853 ක් දරා තිබුණද අලෙවි ප්‍රවර්ධන කටයුතු අසාර්ථකවී තිබුණි. | වියදම් සිදු කිරීමට පෙර අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳ නිසි සැලසුමක් සහිතව අදාල විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයෙකුගේ නිර්දේශය මත සිදු කළයුතු වීම. | එම සමාගම සිදු කල කැණීම් කටයුතු වලදී සොයා ගන්නා ලද ස්වභාවික වායු නිධි නිෂ්පාදනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව ලංසු කැඳවූ අතර, කිසිදු ජාත්‍යන්තර සමාගමක් ඒ සඳහා ඉදිරිපත් වී නැත. |
| (ඒ) | මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන්ගතව සිදු කරන ගුරුත්ව හා චුම්භක සමීක්ෂණ මඟින් දත්ත රැස් කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු, 2012 වර්ෂයේ දී ආරම්භ කලද මෙම ව්‍යාපෘතිය වසර 07 ක් පුරා ලංසු කැඳවීම, ලංසුකරුවන් තෝරා ගැනීම ආදී කටයුතු හැර වෙනත් ප්‍රගතියක් අත්පත් කර ගෙන නොතිබුණි. | අදාල සම්පත් හඳුනා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු වීම. | නිරීක්ෂණය කර ඇති පරිදි 2015.11.18 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණය අනුව මහා බ්‍රිතානයේ ආර්කේන් සමාගම ලංසු ප්‍රධානය කලද එම සමාගම බුන්වත්වීම නිසා ව්‍යාපෘතියේ කටයුතු අතරමඟ නැවතී ඇත.<br>මෙම දත්ත රැස්කර ගැනීම කාවරි හා මන්නාරම් ද්‍රෝණියේ ගවේෂණ බිම් කොටස්වල ලංසු කැඳවීමේදී ඉමහත් රුකුලක් වන බැවින් මෙම ගුවන්ගත දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 පෙබරවාරි මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ගන්නා ලදී. ඒ අනුව පිහිටමින් 2019 අගෝස්තු මස 15 වන දින ලංකා ජනරජය හා මහා බ්‍රිතාන්‍ය සමාගමක් වන Bell Geospace Ltd. අතර ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ව්‍යාපෘතිය 2020 වර්ෂය තුලදී නිමවීමට නියමිතව ඇත. |

## 3.6 විදේශ ආධාර ව්‍යාපෘති

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | --------------- | -------------------------- |
| (අ) | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ, තාක්ෂණික පිරිවිතරයේ 401.7.1 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, අධිවේගී මාර්ගයේ ජාත්‍යන්තර රළු බව පිළිබඳ දර්ශකය කිලෝමීටරයකට මීටර් 1.5 - 2.3 ක පරාසයක පැවතිය යුතු අතර තාක්ෂණික පරීක්ෂණ වාර්තාවන්හිදී කොන්ත්‍රාත්කරුවන් විසින් එම අදාල දර්ශකයන් ලඟාකරගෙන තිබුණි. කෙසේවුවත්, භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි අධිවේගී මාර්ගයේ සමහර කොටස්වල මාර්ගයේ සුමටතාවය ධාවනය වන මෝටර් රථවල යහපත් ධාවන තත්ත්වය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් වී නොතිබුණි. | තාක්ෂණික පිරිවිතර සැකසීමේදී මාර්ගවල ධාවනය වන වාහනවල ධාවන තත්ත්වය සහතිකවීමට අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතුය. | පිරිවිතර අංකය 401.7.1 අනුව මතුපිට (සුමට බව පරීක්ෂා කිරීම සඳහා) ඉංජිනේරු විසින් කිලෝමීටර දහයෙන් එකක (0.1) නියැදි ප්‍රදේශයක් හරහා ගමන් කරන පෘෂ්ඨයේ සුමට බව තීරණය කළ යුතු අතර සෑම ප්‍රදේශයක්ම ජාත්‍යන්තර රළුබව දර්ශකයේ ප්‍රකාශිත සුමට බව මැනිය යුතුය. එම අගය (IRI) 1.5-2.3 m / km අතර අගයන් ගත යුතුය. RDA සැලසුම් අංශය දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා රළුබව සමීක්ෂණය සිදු කර ඇති අතර IRI නිශ්චිත සීමාවන් තුළ පවතින බව ස්ථිර කර ඇත. |
| (ආ) | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියට අදාල ශක්‍යතා වාර්තාවේ 8.33 වගන්තියට අනුව, සේවා ප්‍රදේශයන් කිහිපයක් හඳුනාගෙන තිබුණද, සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් කිසිඳු සැලැස්මක් හෝ ප්‍රමාණ පත්‍ර මඟින් මූලා ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි. ඒ අනුව, දක්ෂිණ අධිවේගී මාර්ගයේ 46 වන කිලෝමීටරයෙහි පිහිටි වැලිපැන්න සේවා මධ්‍යස්ථානයෙන් අනතුරුව කි.මී.173 ක් වූ අධිවේගී මාර්ගයේ අවසානය දක්වා භාවිතා කරන මහජනතාවට අවශ්‍ය සේවා පහසුකම් ලබා ගත නොහැකි තත්ත්වයක් පැවතුණි. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා සේවා ප්‍රදේශයන් සකස්කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුය. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා සේවා ප්‍රදේශයක් අත්‍යවශ්‍ය බව පැහැදිලිය. ඒ අනුව මූලික ඇස්තමේන්තු වල සේවා ප්‍රදේශය සඳහා මිල ගණන් ඇතුලත් කර නොතිබුනද ඉහත අදියර 02 හි ඉතිරි මුදල් භාවිතා කර සේවා ප්‍රදේශය ඉදිකිරීම සඳහා චීන එක්සිම් බැංකුවෙන් අවසර ඉල්ලුවද එම බැංකුව මුදල් ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදි. තවද සේවා ප්‍රදේශය සඳහා සියලුම මූලික සැලසුම් සිදු කර අවසන් බවද දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ උපවගන්ති 2.4 සහ 2.6 ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීමේ කමිටුව විසින් ලංසු ලියවිලි විධිමත් පරිදි ඇගයීමක් සිදුකල යුතු වුවද, දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ කොන්ත්‍රාත් පැකේජ 02 කට අදාලව මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඒ අනුව, ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු පත්‍ර සහ වැඩ ප්‍රමාණ පත්‍ර අතර රේට විෂමතා සහ වැඩ විෂයන් සඳහා වන වැරදි අර්ථ නිරූපණ හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28.73 ක අලාභයක් ව්‍යාපෘතියට සිදුවී තිබුණි. | ව්‍යාපෘතිය සඳහා සිදුවී ඇති අලාභය අය කරවා ගැනීමට කටයුතු කල යුතුය. | මෙම සැපයුම් සඳහා මිල ගණන් සඳහන් කිරීමට ඉඩ සලසා තිබූ ප්‍රමාණ පත්‍ර අංක යටතේ මිල සඳහන් කිරීමට ඉඩ සලසා ඇති අතර එම මිල ගණන් හා ප්‍රමාණ අනුව මුදල ඒ ඒ අයිතමය ඉදිරියෙන් සටහන් කිරීමට ඉඩ සලසා ඇත. එය මුළු කොන්ත්‍රාත් මුදල සඳහා ඉදිරියට ගෙන ගොස් ඇති අතර ඒ අනුව මේ ලබා ගෙන ඇති ගාස්තු අදාල පිරිවිතර වලට ලැබිය ඇති අවම මිල වශයෙන් ගත හැකිය. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට නිකුත් නොකරන ලද ණය මුදල් ප්‍රභවය මත ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනට අදාලව රු. මිලියන 1,180.44 ක් සහ දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනට අදාලව රු.මිලියන 206.03 ක මුදලක් කැපකරු කොමිස් ලෙස ණය සැපයුම් නියෝජිතායතනය වෙත ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ මූලික සැලසුම්වලට අනුව, අපේක්ෂිත කාර්යයන් උපරිම ආකාරයෙන් ඉටුකරගැනීම සහ අදාල නිකුත් කිරීමට අපේක්ෂිත මුළු ණය මුදලම උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. | ණය සැපයුම් නියෝජිතයන් සමඟ එළඹ ඇති ගිවිසුම් ප්‍රකාරව ඉහත ගෙවීම සිදු කර ඇත. ණය ගිවිසුම සක්‍රීය වී දින 60 ක් ඇතුලත ණය මුදල උපයෝගී කර ගැනීම ආරම්භ කල දින සිට උපයෝගී කොට නොගත් ණය මුදල වෙනුවෙන් බැඳීම් ගාස්තු ගෙවීම ණය ගිවිසුම අනුව අනිවාර්ය වේ. |
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.4(iii) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් සඳහා ලබාදෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අදාල කොන්ත්‍රාත්තුවේ මුළු ගෙවීම් වලින් සියයට 90 ක් සම්පූර්ණ වීමට ප්‍රථම අය කර ගත යුතුය. නමුත් පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතිය අදියර III වෙනුවෙන් ලබා දුන් අත්තිකාරම් මුදලින් රු.මිලියන 870 ක් එම කොන්ත්‍රාත්තුවේ මුළු ගෙවීම් වලින් සියයට 99 ක් ගෙවා තිබියදී සහ අදාල ණය ගිවිසුම 2019 දෙසැම්බර් 10 දින අවසන් වීමට පෙරද අය කර ගැනීමට නොහැකිවී තිබුණි. | අදාල අත්තිකාරම් මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කල යුතුය. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ විශේෂත්වයක් දැක්වෙන කොටස තුල ඇති අතුරු කාණ්ඩ 60.7 අනුව මුලු කොන්ත්‍රාත් මුදලින් 90% ගෙවීම් කිරීම සඳහා නිර්දේශ කිරීමේදී ගෙවන ලද මුළු අත්තිකාරම් මුදලම අයකර ගත යුතුව ඇත.<br>මෙම මුළු අගයම 2020 ජනවාරි අවසානය දක්වා වැඩ කිරීම් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අතුරු බිල්පත් අංක 39 මඟින් අයකරගෙන ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:3:1 වගන්තිය හා 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සියළුම පිරිවැය ඇතුලත්වන පරිදි ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කල යුතුය. එහෙත් දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ පැකේජ 01 හා 03 ට අදාලව වැඩ ප්‍රමාණ පත්‍රයේ දක්වා තිබූ පිරිවැය පිළිවෙලින් රු.මිලියන 134.32 හා රු.මිලියන 150 ක් වූ අයිතම 235 න් අයිතම 198 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ඉටුකර නොතිබුණු අතර ඒ අනුව ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 42.65 ක් වූ සවලීකරණ අත්තිකාරම් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති සවලීකරණ අත්තිකාරම් නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය. | වැඩිපුර අත්තිකාරම් මුදල්ගෙවා නොමැති අතර එය ගෙවා ඇත්තේ කොන්ත්‍රාත් කොන්දේසියට අනුකූලව පිළිගත් කොන්ත්‍රාත් මුදල මත මිස අවසාන කොන්ත්‍රාත් මුදල පදනම් කර නොවේ. අත්තිකාරම් ගෙවීම කොන්ත්‍රාත් කාලය ආරම්භයේදී සිදු කෙරේ. කොන්ත්‍රාත් කාලය අවසානයේදී අවසාන කොන්ත්‍රාත් මුදල දැන ගනු ලැබේ. අත්තිකාරම් ගෙවීම දැනටමත් අය කර ගෙන ඇත. |
| (උ) | ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය)<br>(i) ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුවෙන් ජපන් යෙන් මිලියන 12,381 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා 2013 මාර්තු 14 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 ඔක්තෝබර් වන විට ණය ගිවිසුම අත්සන්කර වසර 6ක් සම්පූර්ණ වී අවසන් කර තිබිය දී ඉන් පාලම් 18 ක වැඩ ඉතිරි වී තිබූ අතර ඉතිරි පාලම් 19 ඉදි කිරිම සඳහා වූ කොන්ත්‍රාත්තු ප්‍රදානය කර නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට ඉහත ණය මුදලින් සියයට 57 කට සමාන රු. මිලියන 9,206ක් පමණක් උපයෝජනය කර තිබුණි. මෙම ණය ගිවිසුම 2021 ජූලි 05 දින අවසන් වීමට නියමිත අතර එම කාලසීමාව දීර්ඝ කිරීමට බැංකුව එකඟ නොවීම නිසා ණය ගිවිසුම යටතේ ලබා ගැනීමට නියමිත ඉතිරි ජපන් යෙන් මිලියන 5,378 එනම් රු.මිලියන11,708 ක් | යෝජිත ණය ගිවිසුම් කාලය තුල අදාල කාර්යය උපරිම අයුරින් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. | මෙම ණය මුදල යටතේ පිරිනමන කොන්ත්‍රාත් ජපන් සමාගම් වලට පමණක් පිරිනැමිය යුතු බවට වූ කොන්දේසියක්ද 30% වටිනාකමක් සහිත භාණ්ඩ හො සේවා ජපානයෙන් ආනයනය හෝ ලබා ගත යුතු බවද ණය ගිවිසුමේ සඳහන් වීම නිසා විශාල පාලම 37 ක් ඉදිකිරීමට මෙම ණය මුදල ප්‍රමාණවත් නොවන බව ආරම්භයේ සිටම පෙනී ගොස් තිබුණි.<br>මාර්ග සංවර්ධන අධිකාරිය කොන්ත්‍රාත් පැකේජ පිරිනැමීමට යාමේදී ණය ගිවිසුමේ කොන්දේසි අනුව ජපන් කොන්ත්‍රාත්කරුවන්ටම ඒවා පිරිනැමිය යුතු වීම නිසා මිල ගණන් අධික වීම සේම ඉදිරිපත් වූ කොන්ත්‍රාත්කරුවන් ප්‍රමාණය සිමා සහිත වීම නිසා සාධාරණ තරඟයක් කොන්ත්‍රාත්කරුවන් අතර ඇති නොවූ බවද සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| | හෙවත් මුළු ණය මුදලින් සියයට 43ක් ලබා ගැනීමට නොහැකිව තිබුණි. | | |
| | (ii) එම ණය ගිවිසුමට අනුව පළාත් 05ක පැකේජ් 05ක් යටතේ පාලම් 37ක් ඉදිකිරීමට යෝජිතව තිබුණි. එහෙත් ඉදිකිරීමේ කටයුතු නිසි පරිදි සැලසුම් නොකිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාද සහ පාලම් ඉදිකිරීමේ කටයුතුවල සිදුවූ ප්‍රමාදයන් නිසා අපේක්ෂිත පාලම් 37න් පාලම් 18ක් පමණක් 2018 දෙසැම්බර් 31 වන විට අවසන්කර තිබූ අතර පලාත් 3ක පැකේජ 3ක් යටතේ ඉදිකිරීමට යෝජිත පාලම් 19 ක ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී ඇති අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය. | සිවිල් කොන්ත්‍රාත්තු සඳහා ඉතිරි වූ මුදල යෙන් මිලියන 3,425 ක් වන අතර ඉදිකරන ලද පාලම් වලට වැයවූ මුදල් ප්‍රමාණය සැලකීමේදී මෙම ඉතිරිය උපරිම වශයෙන් තවත් පාලම් 9 ක් ඉදිකිරීමට ප්‍රමාණවත්යැයි බලාපොරොත්තු වුවහොත් සම්පූර්ණයෙන් ඉදිකළ හැකි පාලම් ප්‍රමාණය 27 ක් වේ. ඒ අනුව, ණය ගිවිසුමට ඇතුලත් පරිදි ණය මුදල උපයෝගිකර ගෙන පාලම් 37 ක් ඉදිකළ නොහැකි බව පැහැදිලි වේ. |
| (ඌ | කොන්ත්‍රාත්තු පැකේජ 01 යටතේ වූ ඉංගිරිය රත්නපුර මාර්ගය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් 2018 පෙබරවාරි 27 දින නොඑකඟවීම් 07 ක් වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව රු.මිලියන 1,687 ක වන්දි ඉල්ලා තිබූ අතර ඉන් රු. මිලියන 903.10 ක් 2018 අප්‍රේල් 30 දිනට පොලී ගාස්තුවලින් සමන්විත වී තිබුණි. මෙම හිමිකම් පෑමට ප්‍රධාන හේතුව කොන්ත්‍රාත් කාලය දින 911කින් වැඩිවීම බවත් එම දින දීර්ඝ වීමට ව්‍යාපෘතියේ වැඩ විෂයපථය වෙනස්වීම සහ වැඩ සැලසුම් අනුමත කිරීම ප්‍රමාදවීම හේතුවී තිබූ බවටත් කොන්ත්‍රාත්කරු විසින් බේරුම්කරණයේදී කරුණු දක්වා තිබුණි. 2019 ඔක්තෝම්බර් 16 දිනැති අංක අමප/19/2683/119/095 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රු.මිලියන 1,000 ක් සහ ඊට අදාල බදු මුදල් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. | විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන විදේශ ආධාර ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව තුල අදාල නිමකිරීම් ඉලක්කයන් ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. | කොන්ත්‍රාත් සමාගම මගින් ආරවුල් 07 ක් ආරවුල් බේරුම්කරණය වෙත 2010 වර්ෂයේදී යොමු කරන ලද අතර, ආරවුල් බේරුම්කරු විසින් 2018 වර්ෂයේදි මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරු වෙත දැනට ගෙවා ඇති මුදලට අමතරව රුල මිලියන 1638 ක් ගෙවිය යුතු බවට විනිශ්චය ලබා දෙන ලදී. ඉන්පසුව මාර්ග සංවර්ධන අධිකාරිය හා කොන්ත්‍රත්කරු අතර, ඇති වූ එකගතාවය මත රු. මි. 1000ක් හා ඊට අදාල බදු මුදල් ගෙවීමට එකග විය. |
| (එ) | ශ්‍රී ලංකාවේ රුපියලේ අගය අඛන්ඩව පිරිහෙමින් තිබෙන බැවින් විදේශ අරමුදල් ව්‍යාපෘතිවල විනිමය අලාභ වැඩිවෙමින් තිබේ. ව්‍යාපෘති නියමිත කාලය තුල නිම නොකිරීමත් මෙම විනිමය අලාභ වැඩිවීමට හේතු වී | විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන විදේශ ආධාර ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව | කොන්ත්‍රාත් ගිවිසුමේ නිශ්චිත දිනයකට ශ්‍රී ලංකා රුපියලේ අගයට එරෙහිව ඇමරිකානු ඩොලරයේ අගය නියම කිරීම විනිමය වශයෙන් සිදුව ඇති අලාභයට හේතුව ලෙස දැක්විය |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ඒ අනුව ණය අරමුදල් වලින් කොටසක් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද ව්‍යාපෘති 4 ක සිදු වී තිබූ මුළු විනිමය අලාභ රු.මිලියන 10,161 ක් විය. | තුල අදාල නිමකිරීම් ඉලක්කයන් ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. | හැකිය.<br>අප විසින් අනාගත කොන්ත්‍රාත් ගිවිසුම් වලදී, පරිවර්ථන අනුපාතය ගෙවීම් කරනු ලබන දිනයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද විකුණුම් විනිමය අනුපාතය ලෙස සලකනු ලැබීම සුදුසු බව කාරුණිකව දන්වමි. |
| (ඒ) | සමහර ව්‍යාපෘතිවල කටයුතු අවසන් වීමෙන් පසු එම ව්‍යාපෘති වල වත්කම් හා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන ආයතනය වෙත භාර දී එම ව්‍යාපෘති කාර්යන් කඩිනමින් අවසන් කර නොතිබුණ බැවින් අනවශය ලෙස අතිරේක අරමුදල් ව්‍යාපෘති වෙනුවෙන් වැය කර තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කර ඇති ව්‍යාපෘතිවල වත්කම් හා වගකීම් කාල පමාවකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදීමට කටයුතු කල යුතුය. | ව්‍යාපෘතිය ඇවර කිරීමේ ගිණුම මේ වන විට සකස් කරමින් පවතින බැවින් ව්‍යාපෘතියට අදාල සියළු වගකීම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉදිරියේ දී භාර දීමට කටයුතු කරනු ඇත. |
| (ඔ) | අදියර 4 කින් සමන්විත මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම පිණිස ඕස්ට්‍රේලියානු සමාගමක් වෙත රු.මිලියන 1,759 ක් ගෙවා තිබුණි. අදාල ශක්‍යතා අධ්‍යයනය එකී සමාගමෙන් සිදුකරවා ගෙන අවසන් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබාගැනීමට කටයුතු නොකොට සම්බන්ධිත ශක්‍යතා අධ්‍යයනයක් සඳහා දේශීය ආයතන කිහිපයක් සමඟ රු.මිලියන 97 ක අගයකට ගිවිසුම් ගතවී තිබුණි. | ශක්‍යතා අධ්‍යයනය සම්බන්ධයෙන් වූ වාර්තා කාල පමාවකින් තොරව ලබාගැනීමට කටයුතු කල යුතුය. ශක්‍යතා අධ්‍යයනය සංශෝධනයකට යටත් කල යුතුනම් අදාල පාර්ශවය මඟින්ම එය නිවැරදි කරගැනීමට කටයුතු කල යුතුය. | 2014 දෙසැම්බර් 31 දින වන විට (SMEC)ආයතනයට ගෙවා තිබූ මුළු මුදල රු.1,600,183,080 (බදු සහිත) කි. ඒ වන විට (SMEC) ආයතනය සම්පූර්ණ ශක්‍යතා අධ්‍යනය නිම කර තිබූ අතර එම වාර්තා ව්‍යාපෘති කාර්යාලය වෙත ලබා දී තිබුණි. එම වාර්තා පිළිගත හැකි තත්ත්වයක තිබුණි. කෙසේ නමුත් 2015 දී නැවත උතුරු අධිවේගී මාර්ගය ආරම්භ කරන ස්ථානයේ වන මාර්ග පථයේ පළමු කි.මි. 10 පමණ කොටස වෙනස් කිරීමට රජය තීරණය කළ නිසා (SMEC) ආයතනය කර තිබූ ශක්‍යතා අධයනයට යම් යම් සංශෝධනයන් කළ යුතු විය. ඒ අනුව ආර්ථිකමය ශක්‍යතා අධ්‍යනය සංශෝධනය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟත්, පාරිසරික හා සමාජීය බලපෑම් වාර්තාව යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟත් ගිවිසුම් අත්සන් කරන ලදී. |
| (ඕ) | මධ්‍යම අධිවේගී මාර්ගයේ III වන කොටස වන පොතුහැර සිට ගලගෙදර දක්වා කොටසෙහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2018 මැයි 04 දින කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය | විදේශ ආධාර ව්‍යාපෘති මඟින් විශේෂ ණය මුදල් ලබාගැනීමේදී පිරිවැය අවම වන පරිදි නිසි | 2020 පෙබරවාරි 19 හා 27 වන දිනයන් හීදී පැවති කැබිනට් රැස්වීම් වලදී, මෙම කොටස සඳහා මීට පෙර පැවති ප්‍රසම්පාදන ක්‍රියාවලින් අවලංගු කිරීමට මෙන්ම නව ප්‍රසම්පාදන |

| | | | |
|---|---|---|---|
| | නිකුත් කර තිබූ ජපාන කොන්ත්‍රාත්කරු සමඟ එකඟවූ ක්‍රියාවලිය සහ ටෝකියෝ මිට්ෂුබිෂි යූඑෆ්ජේ ලිමිටඩ් බැංකුව සමඟ පැවති මූල්‍ය සම්පාදන එකඟත්වය අවසන් කිරීම සඳහා 2020 මාර්තු 01 වන දින අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද, ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ 2019 ජූලි 12 දිනැති ලිපිය මඟින් උපදේශක සමාගම සමඟ පැවති ක්‍රියාවලියද අවසන් කර තිබුණි. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් විගණනයට ගැටළුකාරී විය. | කොන්ත්‍රාත්කරුවන් හා මූල්‍යමය ප්‍රතිපාදන සපයන්නන් සම්බන්ධයෙන් නිශ්චිත අධ්‍යයනයක් හා තීරණවලට එළඹිය යුතුය. | ක්‍රියාවලියක් ආරම්භ කිරිමටද මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශයට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර ඇති අතර එම කටයුතු දැනට ක්‍රියාත්මක කරමින් පවතී. |
| (ක) | ශ්‍රී ලංකා මහ බැංකු අග්‍රිම ගිණුම් ප්‍රකාශයේ පෙන්නුම් කරන ලද අග්‍රිම අරමුදල් නැවත අගය කිරීමේ ලාභ සහ අලාභ අදාල ලෙජර් ගිණුම් තුළ වරදවා ගිණුම් ගත කිරීම නිසා ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ යටතේ ගිණුම් වලට පහත බලපෑම් සිදු වී තිබුණි.<br>(i) සමාලෝචිත වර්ෂය තුළ වරදවා ගිණුම් ගත කරන සමුච්චිත ශුද්ධ බලපෑම රු. 1,389,156 ක් වූ නැවත ඇගයීමේ ලාභ සහ අලාභ වල නිවැරදි අගය රු.2,378,196 ක් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ මහ බැංකු අග්‍රිම ගිණුමේ ශේෂය, අග්‍රිම අරමුදල් නැවත ඇගයීමේ ගිණුමේ ශේෂය සහ මුළු ජංගම වත්කම් රු. 3,767,352 කින් අඩුවෙන් දක්වා තිබුණි.<br>(ii)2019 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ රු. 2,778,312 කින් වැඩියෙන් දක්වා තිබුණි.<br>(iii) මහ බැංකු අග්‍රිම ගිණුමේ ශේෂය සහ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂය අතර වටිනාකම රු. 3,767,354 ක වෙනසක් පැවතුණි. | නිවැරදි ගිණුම්කරණ සටහන් තැබීමට කටයුතු කල යුතුය. | මහ බැංකු අග්‍රිම අරමුදල් ගිණුමේ ශේෂය ඩොලරයේ අගය මත මාසිකව ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. 2019 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මාස 5 ක ප්‍රත්‍යාගණනය ප්‍රතිඵලය ගණනය කිරීමේදී ප්‍රමාද දෝෂයකින් අභ්‍යන්තර ජර්නල අංක 5 සදොස්ව සැකසී ඇත. වාසි හා අවාසි විචලන එකිනෙක මාරු වී ඇත. අගෝස්තු, සැප්තැම්බර් හා දෙසැම්බර් මාස 3 ප්‍රත්‍යාගණනය වාසිය සඳහා හර ජර්නල් සටහනක්ද භාවිතා කර ඇත. |

## 3.7 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම යන මැයෙන් නිකුත් කළ අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වියදම් ඒකක වලට ලබාදී තිබූ සම්පත් නිකරුනේ තැබීමෙන් වන පිරිවැය වැළැක්වීම සඳහා සැම පියවරක්ම ගත යුතු බව සඳහන් වුවද, අමාත්‍යාංශය සතුව පැවති වාහනවලින් භාවිත කළ හැකි තත්ත්වයේ පවතින වාහන 07 ක් සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් තොරව අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | දේපල පිරියත උපකරණ සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත්කිරීමට ක්‍රියා කල යුතුය. | 2019.11.18 දින රාජ්‍ය අමාත්‍ය පත්වීම් අහෝසි වීමත් සමඟ එම කාර්යය මණ්ඩලය වෙත අනුයුක්ත කර තිබූ වාහන අමාත්‍යාංශය වෙත නැවත ලබා දී ඇත. එම වාහන මාර්ග සංවර්ධන අධිකාරියේ රථ ගාල තුළ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් යොදවා ඇති ආරක්ෂක නිලධාරීන්ගේ සුපරීක්ෂාව යටතේ අමාත්‍යාංශයේ අනෙකුත් වාහන සමඟ ආරක්ෂිතව ගාල් කර ඇත. |

## 3.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 (i) සහ රජයේ නිලධාරින්ගේ ඇප ආඥාපනතේ 612 වැනි අධිකාරය ප්‍රකාරව අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ මෙන්ම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ ඇප තැබිය යුතු නිලධාරින් කිසිවෙකු ඇප තැන්පත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | මහාමාර්ග අංශය - මු .රෙ.880(i) අනුව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් අවශ්‍යතාවය අනුව ඇප තැම්පත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.<br>ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශය - ඇප අයකිරීම සම්බන්ධව කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. |

## 3.9 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය තුළ 2019 දෙසැම්බර් 31 දිනට කපා නොහල ඉදිරියට ගෙන යන පාඩු හා අත්හැරීම් වශයෙන් එකතුව රු. 1,064,226 ක් වූ රිය අනතුරු 17 ක් වාර්තා කර තිබුණි. එම රිය අනතුරු සිදු වී අවම වශයෙන් වසර 02 ක් ඉක්ම වී තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ශේෂයන් අයකර ගැනීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි. | හානි හා පාඩු කාලීනව ආවරණය කිරීමට හෝ පොත්වලින් ඉවත්කිරීමට කටයුතු කල යුතුය. | විධිමත් අනුමැතිය පරිදි වාහන අනතුරු 11ක් සඳහා පාඩු හා අත්හැරීම් වශයෙන් 2020.02.21 දින රු.366,222ක මුදලක් කපා හැරීම සිදු කර ඇත .අනෙකුත් වාහන අනතුරු සඳහා ද අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතී. |

## 4. තිරසාර සංවර්ධනය

## 4.1 තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ ඉලක්ක සඳහා සූදානම් වීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **මහාමාර්ග අංශය**<br>වාර්ෂික වැඩසටහනෙහි තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කල යුතු වැඩසටහන් ඇතුලත් කර නොතිබුණු නමුත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු 03 කට අදාලව පමණක් ඉලක්කයන් සහ දර්ශකයන් සඳහන් කර එම දර්ශකයන්ට අදාලව ප්‍රගතියක් නිශ්චිතව සඳහන් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීමට අදාලව අරමුණු, ඉලක්කයන් හා දර්ශකයන් නිශ්චිතව හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට නිසි පරිදි ඇගයීමක් ක යුතුය. | **(අ) මහාමාර්ග අංශය**<br>තිරසර සංවර්ධන අරමුණු යටතේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශයේ විෂය පථයට අනුරූපව හඳුනාගත් අරමුණු 03ක් පවති .එම එක් එක් අරමුණු සහ ඊට අදාලව හඳුනාගනු ලැබූ ඉලක්ක හා දර්ශකයන් ළඟා කරගැනීම සඳහා හඳුනාගත් සංවර්ධන ව්‍යාපෘතීන් වල භෞතික ප්‍රගතිය වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 05 වන පරිච්ඡේදය යටතේ නිශ්චිත ව දක්වා ඇත.<br>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ එම එක් එක් අරමුණට අදාල වැඩසටහන් වෙන් වෙන්ව දක්වා නොමැති අතර , ඉදිරි වර්ෂ සඳහා සකස් කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල තිරසර සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් තොරතුරු අන්තර්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | **ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශය** | | |
| | (i) 2017 ජූලි 31 දිනැති අංක BD/CBP/4/1/2-2018 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට සෘජුවම අදාල වන තිරසර සංවර්ධන අරමුණ ලෙස "දැරිය හැකි පිවිතුරු බලශක්තිය"හඳුනාගෙන තිබුණද එම තිරසර සංවර්ධන අරමුණ ඉටුවන ආකාරයට 2019 වර්ෂය තුළ කිසිදු ව්‍යාපෘතියක් සැලසුම්කර හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීමට අදාලව අරමුණු, ඉලක්කයන් හා දර්ශකයන් නිශ්චිතව හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට නිසි පරිදි ඇගයීමක් ක යුතුය. | මෙම අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවන බවද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ,ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය යන ආයතන විසින් ව්‍යාපෘති සිදුකරන බවද දන්වා සිටිමි .ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය මඟින් ද්‍රවීකෘත ස්වභාවික වායු ගවේශනය පිළිබඳ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත . තවද 2018 වර්ෂයේ දී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මඟින් EURO 4 ප්‍රමිතියෙන් යුක්ත ඉන්ධන හඳුන්වාදීම යන ව්‍යාපෘති "දැරිය හැකි පිවිතුරු බලශක්තිය"ලෙස හඳුනාගත හැකි බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය මෙහෙයවීම සම්බන්ධයෙන් 2019දෙසැම්බර් 31 දින වනවිටත් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ මඟපෙන්වීමක් නිකුත් කොට නොතිබුණ අතර ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා අභ්‍යන්තර පාලන විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. | කාලෝචිත මාතෘකා සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නිළධාරීන් වරින්වර දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන අතර අන්තර්ජාතික පරිසර දිනයට සමගාමීව ජාතික වැඩසටහන යටතේ 2019.06.07 දින ඕසෝන් ස්ථරය රැක ගැනීමේ වැදගත්කම පිළිබඳව දේශනයක් පවත්වන ලදී. |
| (iii) | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හා දර්ශක නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. තවද ඒ පිළිබඳව දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණ අතර ඒ සඳහා නිලධාරියෙකු යොදවා නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා ඒ ආශ්‍රිතව දත්ත එක් රැස්කිරීමේ ක්‍රමවේදයක් සම්බන්ධව මේ වන තෙක් මෙම අමාත්‍යාංශය ලිඛිතව දැනුවත් කිරීමක් කර නොමැත.<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා ඒ ආශ්‍රිතව දත්ත එක් රැස්කිරීමේ ක්‍රමවේදයක් සම්බන්ධව මෙම අමාත්‍යාංශය ලිඛිතව දැනුවත් කිරීමෙන් පසු අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| (iv) | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්යමණ්ඩලය ඒ සඳහා යොදවාගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීමට අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. | තිරසර සංවර්ධනයට සෘජුව සම්බන්ධ වන අමාත්‍යාංශයේ වැඩසටහන්වල දී මෙම අමාත්‍යාංශයේ හා ආයතනවලින් ලබා දිය යුතු දායකත්වය මෙවන විටත් ලබා දී ඇත. එසේම සුපිරිසිදු ඉන්ධනයක් වශයෙන් බලශක්ති උත්පාදනය සඳහා අවමකාබන් විමෝචනයක් සහිත ස්වභාවික වායු හඳුන්වා දීමට කටයුතු කරනු ලබන අතර මෙම අමාත්‍යාංශය විසින් දැනටමත් ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහාමාර්ග අංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 වර්ෂයට අදලව සකස්කර තිබූ විගණන සැලැස්ම තුළ විගණන පැවරුම් 32 ක් ඇතුළත් කර තිබූ නමුත් ඉන් පැවරුම් 16 ක අභ්‍යන්තර විගණන කටයුතු ඒ ඒ ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණක වෙත පවරා තිබුණි. ඉතිරි විගණන පැවරුම් 16 අතුරින් අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 වර්ෂයේදී පැවරුම් 08 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව, 2019 වර්ෂය තුල අපේක්ෂිත කාර්යසාධන මට්ටම ලබා කර ගැනීමට අභ්‍යන්තර විගණන අංශය අපොහොසත්වී තිබුණි. | අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය විගණන සැලැස්මට අනුකූලව අනුයුක්ත කිරීමට කටයුතු කර විගණන කාර්යන් කාර්යක්ෂම කර ගැනීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සිදු කරන ලද විගණන පරීක්ෂාවන් 05 ක් සිදු කර ඇත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයෙහි ගිණුම් වර්ෂය අවසාන දිනට කාර්යමණ්ඩල සංයුතිය පහත පරිදිවේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **මහාමාර්ග අංශය**<br>මහාමාර්ග අංශයේ ද්විතීයික මට්ටමේ තනතුරක් වන සංවර්ධන නිලධාරීන් 86 ක පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. අමාත්‍යාංශයේ කාර්යභාරයට සෘජු සම්බන්ධතාවයක් නොමැති මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයන්හි රාජකාරී සඳහා අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් 87 දෙනෙකු නිදහස් කර අමාත්‍යාංශය විසින් ඔවුන් වෙනුවෙන් රු. 12,593,794 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. තවද, මාර්ග සංවර්ධන අධිකාරියට බඳවාගන්නා ලද නිලධාරීන් 30 දෙනෙකු සමාලෝචිත | අමාත්‍යාංශයේ සැබෑ සේවක අවශ්‍යතාවය නිරූපණය වන පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරගැනීම හා ඊට අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. | රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත 2013 වර්ෂයේ දී සංවර්ධන නිලධාරීන් 365 දෙනෙකු මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති අතර ඒ සඳහා කාර්යය මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත. මෙම නිලධාරීන් සියලු දෙනා අමාත්‍යාංශය තුළ රඳවා ගැනීමට නොහැකි වී තිබූ බැවින් ඔවුන්ගේ පදිංචි ස්ථාන ආශ්‍රිත මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල හා ඉංජිනේරු කාර්යාල වෙත |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදී අමාත්‍යාංශයට නිදහස් කර තිබුණි. ඒ අනුව, අනුමත කාර්යමණ්ඩලය නිසි ඇගයීමකින් හා සේවා අවශ්‍යතා නිර්දේශ ගැලපීමකින් තොරව වැඩිකරගැනීමට කටයුතු කර තිබුණි. | | අනුයුක්ත කර ඇත. කෙසේ වෙතත්, මෙම සංඛ්‍යාව අඩු කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් වරින් වර සිදු කරන ලද ඉල්ලීම් මත, මේ වන විට එම සංඛ්‍යාව 220 දක්වා අඩු කර ගැනීමට හැකි වී ඇත. අමාත්‍යාංශයේ අවශ්‍යතාවය අනුව 2019 වර්ෂයේදී ගැළපීම් කර සංවර්ධන නිලධාරී තනතුරු 90ක් යටපත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් කර ඇතත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. තව ද, නිලධාරීන්ගේ ඉල්ලීම මත වෙනත් ආයතන වෙත ස්ථාන මාරුවීම් අනුප්‍රාප්තිකයකු රහිතව නිදහස් කිරීමට කටයුතු කර ඇත. තවද අදාල කාර්යාලය සඳහා නැවත අනුයුක්තියක් සිදු නොවේ.<br>මෙම අමාත්‍යාංශය තුළ පවත්නා කළමනාකරණ සේවා නිලධාරී, රියදුරු හා කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු සඳහාත්, අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු කරගෙන යාම සඳහාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 30 දෙනෙකු තාවකාලිකව අනුයුක්ත කර ගෙන ඇත. |
| **(ආ)** | **ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශය**<br>තාත්ත්වික සේවා මට්ටමක් පවත්වාගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදුකිරීමට නොහැකිවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 04 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 02 ක්ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 18 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක්ද, වශයෙන් පුරප්පාඩු 32 ක්පැවතුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට ආයතනයේ පුරප්පාඩු සංඛ්‍යාව ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී සියයට 33 ක්විය. | අමාත්‍යාංශයේ සැබෑ සේවක අවශ්‍යතාවය නිරූපණය වන පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරගැනීම හා ඊට අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. | තනතුරුවල පුරප්පාඩු පැවතීම සම්බන්ධව නොයෙක් විට අදාල ආයතන වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර මේ වන විට සංවර්ධන නිලධාරී **06** දෙනෙකු පුරප්පාඩු සඳහා අනුයුක්ත කර ඇත. |

**6.2 මානව සම්පත් සංවර්ධනය නිසිපරිදි සැලසුම් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **මහාමාර්ග අංශය**<br>2019 වර්ෂය සඳහා ප්‍රධාන පුහුණු වැඩසටහන් 13 ක් ක්‍රියාත්මකකිරීමට සැලසුම් සකස්කර තිබුණත් එම සැලසුමේ සඳහන් වැඩසටහන් 02 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. පුහුණු සැලැස්ම සැකසීමේදී එක් එක් පුහුණු වැඩසටහන සඳහා ඇස්තමේන්තු පිරිවැය, සහභාගී වන නිළධාරීන් ගණන, වැඩසටහන පවත්වනු ලබන කාලසීමාව පිළිබඳව නිවැරදිව සැලසුම් කර පුහුණු සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව පුහුණු සැලසුම සකස්කිරීමේදී එක් එක් පුහුණු වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත පිරිවැය, සහභාගී වන නිළධාරීන් ගණන, වැඩසටහන පවත්වනු ලබන කාලසීමාව පිළිබඳව නිවැරදිව සැලසුම් කර ගත යුතුය. | අමාත්‍යාංශ නිලධාරීන්ගේ වැඩ**,** ආකල්ප හා ධාරිතා සංවර්ධනය කරනු වස් 2019 වර්ෂය සඳහා ප්‍රධාන ධාරාවන් යටතේ පුහුණු වැඩසටහන් 13**ක්** සැලසුම් කර තිබුණ ද**,** නිලධාරීන්ගේ ඉල්ලීම් හා පුහුණු අවශ්‍යතාවන් මත අවස්ථානුකූලව ඇමුණුම **8** හි පරිදි නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇත. ඒ අනුව**,** විවිධ පුහුණු වැඩසටහන් **28** ක් හා සම්මන්ත්‍රණ 7 ක් වශයෙන් සමස්ථ පුහුණු වැඩසටහන් **35** ක් 2019 වර්ෂය තුළ පවත්වා ඇත. එකී වැඩසටහන් මඟින් විධායක නිලධාරීන් ඇතුළුව සමස්ත නිලධාරීන් 279 ක් සඳහා පුහුණු අවස්ථා ලබා දී ඇත. |